# I. සංක්ෂිප්තය

අධ්‍යාපන දක්ෂතා ඇති දුගී දරුවන් ට අධ්‍යාපනය කරගෙන යාම සඳහා මූල්‍යමය ආධාරයක් ලබා දීම හා මධ්‍ය විද්‍යාලවල අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව ලබා දීමේ අරමුණින් වර්ෂ 1935 දී ආරම්භ කළ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අදවන විට දැඩි තරඟකාරී විභාගයක් බවට පත්වී ඇත්තේ මධ්‍ය විද්‍යාල සංකල්පය වෙනුවට ජනප්‍රිය පාසල් සංකල්පය ආදේශවීම හේතුවෙනි. මේ හේතුවෙන් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් අවාසි සහගත කණ්ඩායමක් බවට පත්වීම, මෙම අධ්‍යයනයට පාදක විය. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ සාධනයේ විෂමතා යන මාතෘකාව යටතේ සිදුකරනු ලැබූ මෙම අධ්‍යයනය අරමුණු 3 ක් මත පදනම් විය. ඒවා නම් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් විෂය සාධනයෙහි දුර්වලතා දක්වන ක්ෂේත්‍ර හඳුනා ගැනීම, එම දුර්වලතාවන් ස්ත්‍රී පුරුෂ භාවය, මාධ්‍යය හා දිස්ත්‍රික්කය අනුව විචලනය වන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම හා සාධනයේ දුර්වලතා මග හරවා ගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම යන කරුණු ය. මෙම අධ්‍යයනයේ සාහිත්‍ය විමර්ශනය යටතේ වූ න්‍යායාත්මක විමර්ශනයේදී හොවාර්ඩ් ගාඩ්නර්, ඇන්ඩර්සන්, ජීන් පියාජේ, ස්ටර්න්බර්ග්, විගොට්ස්කි යන න්‍යායාචාර්යවරුන්ගේ න්‍යායන් ඉදිරිපත් කරන අතර, ආනුභවික සාහිත්‍ය විමර්ෂණයේදී විදේශීය හා දේශීය අධ්‍යයන, මෙම අධ්‍යයනයේ අරමුණුවලට අදාළව ඉදිරිපත් කරන ලදී. මුළු දිවයිනම නියෝජනය වන පරිදි 2015 සිට 2019 වර්ෂ දක්වා විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ගෙන් 46811ක් නියැදිය ලෙස තෝරාගත් අතර අන්තර්ගත විශ්ලේෂණ ආකාරයේ පර්යේෂණයක් ලෙස මෙය සිදුකරන ලදී. ලේඛන පරීක්ෂාව මගින් දත්ත එක් රැස් කිරීම සිදුකළ අතර ලේඛන ලෙස යොදා ගත්තේ විභාගයේ ඇගයීම් පරීක්ෂකවරුන් විසින් සම්පූර්ණ කරනු ලබන RD ආකෘති පත්‍ර හා ජර්නල්ය. මූලික සංඛ්‍යාන විශ්ලේෂණ හා සහසම්බන්ධතා සංගුණකය භාවිතයෙන් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ සාධනයේ වෙනසක් ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු විෂය ක්ෂේත්‍ර ආකාරයට විශ්ලේෂණය කිරීම සිදුකරන ලදී. එහිදී, ගණිත විෂය ක්ෂේත්‍රය අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට වඩාත් දුෂ්කර බව හඳුනාගත් අතර අනෙකුත් විෂයන්වලද සාධන දුර්වලතා ඇති බව හඳුනාගන්නා ලදී. ස්ත්‍රී පුරුෂ භාවය හා දිස්ත්‍රික්ක අනුව කරන ලද විශ්ලේෂණයේ ගණිත විෂය ක්ෂේත්‍රය වඩාත් දුෂ්කර දිස්ත්‍රික්ක හා පළමු බස විෂය ක්ෂේත්‍රය වඩාත් දුෂ්කර දිස්ත්‍රික්ක හඳුනා ගන්නා ලදී. අධ්‍යයනයේ තුන්වන අරමුණට අනුව සාධනය ඉහළ නැංවීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම සඳහා දරුවන්ට වඩාත් දුෂ්කර වූ විෂය කොටස් හා ප්‍රශ්න හඳුනා ගැනීම හා සාධනය ඉහළ නැංවීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම සිදුකරන ලදී. මෙම අධ්‍යයනයේ නිගමන ලෙස 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේදී අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට ගණිතය හා පළමු බස විෂය ක්ෂේත්‍රය වඩාත් දුෂ්කරතා ගෙන දෙන බව, සමස්තයක් ලෙස ගැහැණු දරුවන් පිරිමි දරුවන්ට වඩා වැඩි සාධනයක් පෙන්වන බව, මඩකලපුව, යාපනය, මන්නාරම හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පළමු බස විෂය මෙන්ම, මඩකලපුව, යාපනය, මන්නාරම, කිලිනොච්චි, මුලතිව්, මාතලේ හා රත්නපුර දිස්ත්‍රික්කවල දරුවන්ට ගණිතය විෂය වඩාත් දුෂ්කර බව දැක්විය හැකිය. එම දුර්වලතා අවම කර ගැනීම සඳහා මූලික ගණිතකර්ම පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක අවබෝධය දරුවාට ලබාදීම, නිවැරදි වාක්‍යයක් සකස්කිරීමට දරුවා තුළ හැකියාවක් ඇති කිරීම, අවට පරිසරයේ ඇති දෑ පිළිබඳ නිරීක්ෂණය කිරීමට දරුවා වැඩි වශයෙන් යොමු කිරීම දැක්විය හැකි වේ.

# I. Abstract

The Grade 5 Scholarship Examination which was started in 1935 with the intentions of giving bursaries to capable but economically disadvantaged students to continue their studies and to provide opportunities to study in Central Colleges has become highly competitive at present due to the shift of concepts from 'Central Colleges' to 'Popular Schools'. The students who come from families with a background of lower income becoming a disadvantaged group due to the above-mentioned shift has become the basis of this study. This study conducted under the topic 'The discrepancies of the performance of candidates belonging to the families with lower income at the Grade 5 Scholarship Examination' is based of 3 objectives. They are, identifying the subject areas that the candidates who come from families with a lower income are showing weaknesses, study how those weaknesses are related to the variables male/female, medium and district and also to make recommendations for them in order to overcome those weaknesses. During the theoretical investigations for the literature review of this study the theories of Howard Gardener, Anderson, Jean Piaget, Sturnburg, and Vygotsky are put forward and also in empirical literature review local and global studies relevant to this study is presented. A representative sample of 46,811candidates covering the island from years 2015-2019 was selected and this was conducted as an analysis of context type. The data was collected referring to documents such as RD forms and evaluation journals filled by chief examiners. After verifying that there is a difference in performance of candidates who come from families with a low income using basic statistical calculations and correlation co-efficient, analyses were done for each and every subject areas. Here, it was identified that Mathematics has been more difficult to candidates who come from families with a lower income and also it was revealed that there are drawbacks in their results among other subject areas too. According to a District level analysis concentrating on Gender factor as well, the districts where the candidates showed difficulties in Mathematics and First Language were identified. In order to make recommendations to increase the performance of candidates according to the 3$^{rd}$ objective of the study, the difficult subject areas for the said sample of students and exact difficult questions were identified. As conclusions of this study, Mathematics and First language are found to be the most difficult subjects for the candidates who belong to the families with a lower income. And as a whole, female candidates have performed higher than the male candidates. It can be specified that the candidates who come from the background of lower income who are from Batticaloa, Jaffna, Mannar and Polonnaruwa districts shows difficulty for First Language while candidates from Batticaloa, Jaffna, Mannar, Kilinochchi, Mullaitivu, Matale and Ratnapure districts shows difficulty in Mathematics. With the aim of minimizing the aforementioned

weaknesses, it can be recommended that the students must be given an understanding of the basic mathematical operations through theoretical knowledge and real-world experiences, they must be given the ability to produce a correct sentence on their own and they must be directed to observe the objects in the environment closely.